හිතවත් ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

**විභාග පැවැත්වෙන කාල සීමාවන් තුලදී ඔබට වැදගත් වන සහ ඔබ විසින් පිලිපැදිය යුතු කරුණු කිහිපයක් පහත දක්වා ඇත. මෙම සියලු පියවරයන් පවතින COVID 19 අවදානම තුල ඔබගේ සහ විශ්වවිද්‍යාල කාර්‍ය මණ්ඩලයේ ආරක්ෂාව මත පදනම්ව පමණක් ගෙන ඇති බව අවධාරණය කිරීමට කැමැත්තෙමි.**

01. නේවාසිකාගාර සහ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ රැඳී සිටින කාලයේ දී සියලුම සිසුන් විශ්වවිද්‍යාල COVID-19 මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදිය යුතුය.

02. සියලුම ආකාරයේ රැස්වීම් සහ කණ්ඩායම් අධ්‍යයන සැසි දැඩි ලෙස තහනම්ය.

03. විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ඇති සියලුම අධ්‍යයන ශාලා / කාමර විභාග පැවැත්වෙන කාල සීමාව තුල වසා තැබෙනු ඇත.

04. විභාග කාලය තුළ බාහිර නේවාසිකාගාර වල සිට විශ්වවිද්‍යාලය දක්වා අදාළ පීඨ කාර්යාලයන්හී සම්බන්ධීකරණයෙන් ප්‍රවාහන කටයුතු සිදු කරනු ලැබේ.

05. විභාග අපේක්ෂකයින් විභාග කාලය තුළ බාහිර සමාජය සමඟ ඔවුන්ගේ සම්බන්ධතා සහ නිරාවරණය උපරිම ලෙස සීමා කිරීම අනිවාර්ය වේ.

06. සියලුම විභාග අපේක්ෂකයින් සෑම විටම සමාජ දුරස්ථභාවය පවත්වා ගත යුතු අතර මුහුණු ආවරණ නිසි ලෙස පැළඳීම අනිවාර්ය වේ.

07. 2021 ජනවාරි 31 වන දින උදේ 8 සිට සවස 6 දක්වා විභාග අපේක්ෂකයින්ට නේවාසිකාගාර වෙත පැමිණිය හැකිය.

08. නේවාසිකාගාර පහසුකම් ලබා ඇති විභාග අපේක්ෂකයන්, විභාගවලට සහභාගී වීමට හැර නේවාසිකාගාරයෙන් පිටව නොයන ලෙස තරයේ අවවාද කරනු ලැබේ.

10. නේවාසිකාගාර තුළ ඇති ආපන ශාලා, විශ්වවිද්‍යාලීය වෙළෙඳ සැල, හිල්ටන් ආපනශාලාව, විශ්වවිද්‍යාලීය කාර්‍ය මණ්ඩල ආපනශාලාව පමණක් මෙම කාලය තුලදී සිසුන්ගේ අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා විවෘතව ඇත.

11. ආපනශාලා හිමියන්ට ආහාර පැකට් පමණක් විකිණීමට අවසර ඇත. ආහාර මිලදී ගත් පසු, සිසුන් වහාම ආපනශාලාවෙන් පිටවිය යුතුය. නේවාසිකාගායේ ඔබට වෙන් කර ඇති කාමරය තුල ආහාර අනුභව කල හැක.

12. ඔබගේ ආහාර වේල, අදාළ ආපනශාලා වලින් කලින් ඇණවුම් කිරීමට හැකියාව ඇත.

13. ආපනශාලා පහසුකම් නොමැතිව පර්යන්ත නේවාසිකාගාරවල නවාතැන් ගෙන සිටින සිසුන්ට නේවාසිකාගාර කාර්ය මණ්ඩලය හරහා ආහාර ඇණවුම් කළ හැකි අතර ඇණවුම් කළ ආහාර අදාළ නේවාසිකාගාරයට ලබා දීමට පහසුකම් සලසනු ලැබේ.

14. නේවාසිකාගාරය පරිශ්‍රයට ඇතුළුවීමට පෙර සියලුම විභාග අපේක්ෂකයන් COVID 19 මාර්ගෝපදේශ පිළිපදින බවට සහතික කරමින් ප්‍රකාශන පෝරමයකට අත්සන් කළ යුතුය.

15. සියලු සිසුන් නේවාසිකාගාර පරිශ්‍රය තුළ රැඳී සිටින කාල සීමාවේ දී සිය සංචරණයන් උපරිම ලෙස සීමා කළ යුතු අතර සෑම විටම සමාජ දුරස්ථභාවය පවත්වාගත යුතුය. සියලුම සිසුන් තමන්ට පවරා ඇති කාමරවලින් පිටතට පැමිණෙන විට නියමිත මුහුණු ආවරණ නිසි ලෙස පැළඳිය යුතු ය.

16. විශ්වවිද්‍යාල ප්‍රධාන වෛද්‍ය නිළධාරිවරයාගේ නිර්දේශය මත ඇතැම් සිසුන් නේවාසිකාගාර පරිශ්‍රයේ පිහිටි හුදකලා කාමරවලට අනියුක්ත කළ හැකිය.

17.. සෑම සිසුවෙකුම තමන්ට පවරා ඇති නේවාසිකාගාර කාමර තුළ ම රැඳී සිටිය යුතුය. කිසිඳු හේතුවක් මත සිසුන්ට වෙන් කළ කාමර වෙනස් කළ නොහැකි ය.

18.. පවත්නා වෛද්‍ය තත්ත්වයන් මත පදනම්ව ඇතැම් සිසුන්ගේ වෙන් කළ කාමර විශ්වවිද්‍යාල වෛද්‍ය නිළධාරිවරයාගේ නිර්දේශය මත වෙනස් කළ හැකිය. එය එසේ වී නම් එම සිසුන් නේවාසිකාගාර පාලකයන්ගේ මඟ පෙන්වීම මත අලුතෙන් වෙන් කරන ලද නේවාසිකාගාරවලට හෝ කාමර වෙත යා යුතු ය.

19.. මීට පෙර නේවාසිකාගාර පහසුකම් ලබා ඇති සිසුන්ට මෙම විභාග කාලය තුළ වෙනත් නේවාසිකාගාරයකට හෝ කාමරයකට අනුයුක්ත කළ හැකිය. එවැනි අවස්ථාවක එම සිසුන්ට කිසිඳු හේතුවක් මත ඔවුන්ගේ පෙර නේවාසිකාගාරවලට හෝ කාමරවලට යාමට අවසර නැත.

20. සිසුන්ගේ වෛද්‍ය අවශ්‍යතා සඳහා සති අන්තයේ පවා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. කාර්යාල වේලාවෙන් පසු වෛද්‍ය අවශ්‍යතා සඳහා පූර්ණ කාලීන උපශාලාධිපතිවරුන් සාමාන්‍ය ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ඇත.

21.. සිසුන්ට නිසි අවසරයකින් තොරව නේවාසිකාගාරයෙන් පිටවීමට අවසර නැත.

22.. නේවාසිකාගාරවලට කිසිඳු අමුත්තෙකු රැගෙන යාමට සිසුන්ට අවසර නොමැත.

23.. නිසි අවසරයකින් තොරව රාත්‍රී 8 න් පසු නේවාසිකාගාරවලට ඇතුලුවීමට සිසුන්ට අවසර නොමැත.

24. සිසුන්ට ඔවුන්ගේ ආගමික කටයුතු සිදුකළ හැක්කේ ඔවුන්ට පවරා ඇති කාමර තුළ පමණි. කණ්ඩායම් ආගමික කටයුතුවලට අවසර නොමැත.

25. නේවාසිකාගාර පරිශ්‍රය තුළ රැස්වීම්, කණ්ඩායම් අධ්‍යයන සැසි පැවැත්වීම සපූරා තහනම්ය.

26. නේවාසිකාගාරයට ඇතුළු වන සෑම අවස්ථාවකදීම සියලුම සිසුන් තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

27. නේවාසිකාගාරයට ඇතුළු වන සෑම අවස්ථාවකදීම ශරීර උෂ්ණත්වය නිසි ලෙස මැනීම අනිවාර්ය වේ.

28. පවතින වාතාවරණය මත නේවාසිකාගාර තුලට සිසුන් ඇතුලත් කිරීම ඉතා සුපරික්ෂාකාරීව කල යුතු බැවින් එහිදී යම් යම් ප්‍රමාදයන් ඇති විය හැකිය. එම අවස්ථාවන් වලදී ඉවසීමෙන් හා සංයමයෙන් යුතුව ක්‍රියා කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

29. විභාග අපේක්ෂකයින් නේවාසිකාගාරවලට ඇතුලත් වීමේදී සහ විභාගවලට සහභාගී වීමට පෙර ඔවුන්ගේ පෞද්ගලික සුවතාවය ගැන සැලකිලිමත් විය යුතුය. නේවාසිකාගාරවලට ඇතුළත්වීමේදීල නේවාසිකාගාරවල රැදී සිටියදී සහ/හෝ විභාගවලට සහභාගී වීමේදී කිසියම් සිසුවෙකුට COVID 19 බවට සැක සහිත රෝග ලක්ෂණ දැනේ නම් ඔවුන් විශ්වවිද්‍යාල / පීඨ පරිශ්‍රයට පිවිසීමට පෙර වහාම විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයට සහ අදාළ පීඨ කායර්ාලයට දුරකථන ඇමතුමකින් දැනුම් දිය යුතුය.

30.විභාග කාල සීමාව තුළ කිසියම් විභාග අපේක්ෂකයෙක් පහත සඳහන් කවර හෝ තත්වයකට මුහුණ දුන හොත් වහාම දුරකථන ඇමතුමක් මගින් විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයට හා පීඨ කායර්ාලයට දැනුම් දිය යුතුය.

- ඔබ COVID 19 රෝගියෙකු ලෙස තහවුරු වුව හොත් හෝ සැක කළහොත්
- තහවුරු කරන ලද හෝ සැක කරන ලද COVID-19 රෝගියෙකුගේ සමීප සම්බන්ධතාවයක් ලෙස ඔබ හඳුනාගෙන තිබේ නම්
- ඔබට හෝ ඔබේ පවුලේ සාමාජිකයින්ට නිරෝධායනය කිරීමට උපදෙස් දෙන්නේ නම්

**31. සියලුම විභාග අපේක්ෂකයින් නේවාසිකාගාරවල සහ පීඨ /විශ්ව විද්‍යාල පරිශ්‍රයන්හි රැදී සිටින කාලය තුළ විශ්ව විද්‍යාල COVID 19 මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කළ යුතුය.විශ්ව විද්‍යාල COVID 19 මාර්ගෝපදේශ වලට සිසුන් අනුගත වීම නිරීක්ෂණය කිරීම සඳහා සියලුම ආචාර් ය වරුන්ට, ශිෂ්‍ය උපදේශකයින්ට, නේවාසිකාගාර පාලකවරුන්ට, සහකාර ශිෂ්‍ය උපදේශකයින්ට, විශ්ව විද්‍යාල මාෂල්වරුන්ට, නේවාසිකාගාර උප පාලකවරුන්ටල සහ ආරක්ෂක නිලධාරීන්ට බලය ඇත. විශ්ව විද්‍යාල COVID 19 මාර් ගෝපදේශයන්ට අනුකූල වීමට අපොහොසත් වීම නේවාසිකාගාර පහසුකම් අහිමි වීමට හා/හෝ අධ්‍යයන වෂර්යේ ඉතිරි විභාග වලට පෙනී සිටීම සඳහා නුසුදුස්සකු වීමට හේතු විය හැකිය.**

අධ්‍යක්ෂ / ශිෂ්‍ය කටයුතු

27/01/2021